# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2359/36 – 2023 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා – 2023.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2017/188.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.08.09 දිනැති හා අංක 2083/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.07.31 වැනි දින දරන නියෝග යෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පොල්ගස්ඕවිට, පාලගම, ජම්බුගස්වත්ත මාවත, අංක 65/ඒ හි පදිංචි ඒ.එම්.ඩී.එස්. අලහකෝන් මිය සහ බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234හි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.09.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම් කිරීමේ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**

නඩු අංකය : A/55/2018.
ආරාවුල් අංකය : IR/COM/03/2017/188.

ඒ.එම්.ඩී.එස්. අලහකෝන් මහත්මිය
නො. 65ඒ, ජම්බුගස්වත්ත මාවත,
පාලගම,
පොල්ගස්ඕවිට.

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
නො. 234,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත,
බත්තරමුල්ල.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල සඳහා

ප්‍රදානය

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2018.07.31 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

"ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ S-II ශ්‍රේණියේ යතුරු ලේඛිකාවක ලෙස සේවය කරන ඒ.එම්.ඩී.එස්. අලහකෝන් මහත්මියට 2015.04.07 දිනැතිව ලබා දෙන ලද චෝදනා පත්‍රය හා 2016.01.14 දිනැති සංශෝධිත චෝදනා පත්‍රය පදනම් කරගනිමින් පවත්වන ලද විනය පරීක්ෂණය නිවැරදි හා සාධාරණ ද එම විනය පරීක්ෂණය ප්‍රකාරව ලබා දෙන ලද විනය නියෝගය යුක්ති සහගත වන්නේද? එසේ නොවේ නම් ඇය වෙත ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

**පෙනී සිටීම**

මෙම නඩුවේ පළමුවැනි පාර්ශ්වය ලෙස තමාට අසාධාරණයක් සිදුවී යයි පවසමින් සහනයක් පතන ඒ.එම්.ඩී.එස්. අලහකෝන් මහත්මිය නඩු කටයුත්තේ විභාගයන් පැවති සෑම අවස්ථාවකටම සහභාගි විය. ආරම්භයේදී මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් බේරුම්කරණ විභාගය අවසන් වන දින තෙක් පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියේ බලය පවරන ලද ජී.ඩබ්ලිව් ග්‍රේෂන් සිල්වා මහතා ය.

දෙවැනි පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් මුල් දිනයේදී නීතිඥ සහායක් නොමැතිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මානව සම්පත් කළමනාකාර ඩී.එල්.එස්.කේ. ගුණරත්න මහතා පැමිණ සිටි අතර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් වන දිනූෂි චතුරිකා මහත්මිය, ඩබ්ලිව්.කේ.ඒ. ඉන්දුමතී මහත්මිය, යූ.කේ.එල්.පී.අයගම මහත්මිය, ආර්.එම්.අයි.එස්. රත්නායක මහත්මිය

වරින් වර පෙනී සිට ඇත. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නඩුවේ දෙවැනි දිනයේ සිට පෙනී සිටියේ නීතිඥ රොහාන් විජේසිංහ මහතා ය. පසු ව ආයතනයේ නීති නිලධාරිනි අනුරාධා ජයවර්ධන මහත්මිය දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියා ය.

**බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙම නඩුව 2019.02.11 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. එදින දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ නිලධාරිනියක සහභාගි වී නීතිඥ සහාය ලබාගෙන ඉදිරිපත් වීම සඳහා දින ඉල්ලා සිටියේ ය. පළමු සහ දෙවැනි ප්‍රකාශයන් පාර්ශ්වයන් දෙකට ම හුවමාරු කර භාරදෙනු ලැබ, ඒවා ද සැලකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ දැඩි උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසුවූයෙන් විභාගය ඇරඹුණි. නඩුව 2019.03.29, 2019.04.09, 2019.06.11, 2019.08.16, 2019.10.09, 2019.10.31, 2020.01.22, 2020.03.10, 2020.08.10, 2020.09.30 සහ 2020.01.04 යන දිනයන් 11කට කැඳවා විභාගය පවත්වන ලදී. දින නියම කරන ලද නමුත් 2019.03.29, 2019.05.13, 2019.07.08, 2019.09.23, 2019.11.26, 2020.02.14, 2020.04.01, 2020.08.27 සහ 2020.10.19 යන දිනයන් 09 හි දී පරීක්ෂණ විභාගය නොපැවැත්විණි. මෙම පරීක්ෂණය අතරතුර දී ඉල්ලුම්කාරිය අසනීප තත්ත්වයකට පත්වීමෙන් පරීක්ෂණය කල් තැබීමක් කරන ලද බව ද සටහන් කරමි.

මෙම බේරුම්කරණ විභාගයේදී හබයකින් තොර ව පළමුවැනි පාර්ශ්වය සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර, එම පාර්ශ්වය වෙනුවෙන් සහනය පතන ඒ.එම්.ඩී.එස්. අලහකෝන් මහත්මිය වෙනුවෙන් ඇයගේ මූලික සාක්ෂිය දෙපාර්ශ්වයේ එකඟතාව මත දිවුරුම් පෙත්සමක් මාර්ගයෙන් ඉදිරිපත් කෙරුණි. පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් මෙහෙයවනු ලැබූ එක ම සාක්ෂිය එය පමණක් වූ අතර ඒ 1 සිට ඒ 13 දක්වා ලේඛන අධිකරණගත කරමින් පළමුවැනි පාර්ශ්වයේ නඩුව අවසන් කරන ලදී. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහකාර කළමනාකාරිනී (පරිපාලන හා මානව සම්පත්) යූ.කේ.එල්.පී. අයගම මහත්මිය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී (අභ්‍යන්තර විගණන) යන දෙදෙනාගේ වාචික සාක්ෂි ඉතා දීර්ඝ වශයෙන් මෙහෙයවනු ලැබුණි.

**කරුණු සම්පිණ්ඩනය, නිරීක්ෂණ සහ නිර්දේශ :**

පළමුවන පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය වන ඒ.එම්.ඩී.එස්. අලහකෝන් මහත්මිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට 1999.02.18 වැනි දින බඳවා ගෙන ඇති අතර මෙම බේරුම්කරණ විභාගයේදී ඒ 1 ලෙස ලකුණු කළ විධිමත් පත්වීම් ලිපිය ප්‍රකාරව 2000.06.01 දින සිට IV වන ශ්‍රේණියේ සිංහල යතුරු ලේඛිකාවක වශයෙන් ඇය පත් කරනු ලැබ ඇත.

ඇය අඛණ්ඩ ව අවුරුදු විස්සකට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර සිටි අතර මෙම කාර්මික ආරාවුලට හේතු වූ කාරණය සිදුවන අවස්ථාව වන විට ඇය විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පන්නිපිටිය පුහුණු මධ්‍යස්ථානයේ සේවය කරමින් සිට ඇත. නිල වශයෙන් ඇයට පහත සඳහන් රාජකාරී ඇයට නිකුත් කර තිබුණු දාතමක් සහ අත්සනක් නොමැති A5 ලෙස ලකුණු කළ රාජකාරී ලැයිස්තු උධෘතයෙන් කියැවේ.

- “පුහුණු උපදේශිකාවන් පාඨමාලාවන් පවත්වනු ලබන නියමිත දිනයන් සඳහා යොමු කිරීම සහ ඔවුන් සම්බන්ධ අනෙකුත් රාජකාරී කටයුතු සිදු කිරීම.
- ජාතික ආධුනිකත්ව ආයතනය මගින් පවත්වන NVQ විභාග සම්බන්ධ සියලු ම කටයුතු සිදු කිරීම.
- මාසික කාලසටහන සකස් කිරීම.
- පුහුණු පාඨමාලාවන්හි නියුතු පුහුණුලාභීන් විසින් සකසන ලද ආහාර පරීක්ෂා කිරීම.
- සෑම සතියකම සුළු මුදල් පොත පරීක්ෂා කොට යම් ගැටළුවක් ඇතොත් ඉහළ කළමනාකාරිත්වයට යොමු කිරීම.
- පුහුණු පාඨමාලාවන්ට අදාළ පරිගණක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (පළමු හා අවසන් ලැයිස්තු සකස් කිරීම හා ප්‍රධාන කාර්යාලයට යැවීම.)
- අවස්ථානුකූල ව සහකාර කළමනාකරු විසින් පවරනු ලබන වෙනත් රාජකාරී කටයුතු සිදු කිරීම.”

එහි ඇයගේ තනතුර ලෙස සඳහන් වන්නේ "පොදු සහකාර" යන්නයි. ඇයගේ නිල පත්වීම "සිංහල යතුරු ලේඛක" තනතුර වුවත් මෙහි දී ඇයගේ නිල සේවා නාමයත්, රාජකාරී ස්වභාවයත් වෙනස් කොට සේවයේ යොදවා ඇති බව පෙනේ. මෙම පන්නිපිටිය පුහුණු මධ්‍යස්ථානයේ දී සිදුවන මහජන සේවා කාර්යය වන්නේ විදේශගත වීමට අපේක්ෂා කරන පුද්ගලයින්ට විදේශ රටක දී සේවය කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීමයි. ඉල්ලුම් කාරිය සාක්ෂි දෙමින් මෙසේ කියා සිටියා ය.

“ප්‍ර : පුහුණුවීම් මධ්‍යස්ථානයකදී ගෘහ සේවිකාවක් සඳහා ලබා දෙන්නේ කොයි වගේ පුහුණුවක් ද?

පි : ඒ රටවල් වල තියන එක එක මැෂින් වර්ග ක්‍රියාත්මක කරන හැටි. ඒගොල්ලන්ට කන්න බොන්න හදන හැටි ගැන ඒගොල්ලන්ගෙ කෑම ගැන”

තවද දෙවැනි පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් සාක්ෂි දුන් එහි පරිපාලන නිලධාරී යූ.කේ.එල්.පී. අයගම මහත්මිය තවදුරටත් ඒ කාරණය පැහැදිලි කළා ය.

" ප්‍ර : විදේශ රැකියාවන් සඳහා සුදුසු පුද්ගලයන් විදේශ රැකියාවන් සඳහා යොමු කිරීමට ලංකා විදේශ සේවා කාර්යාංශය මැදිහත් වෙලා තියෙනවා ද?

පි : ඔව්. පුහුණු කිරීම් කටයුතුවලින් එසේ සිදු කරනු ලබනවා. එතකොට අපේ පුහුණු මධ්‍යස්ථානවලට එන පුහුණුලාභීන් පුහුණුවට අදාළව ඒ ගොල්ලන්ගේ රටේදී ජීවත්වෙන්නේ කොහොමද, මොනව හරි ගැටලුවක් වුණාම මුහුණ පාන්න ඕන කොහොමද වගේ දේවල්වලට කටයුතු කරන්නේ කොහොමද, ගිහිල්ලා බඩු භාණ්ඩ පරිහරණය කරන්නේ කොහොමද ඒ වගේ සාමාන්‍යයෙන් සියලුම අවශ්‍ය වන පුහුණු කටයුතු සිදු කිරීම කරනු ලබනවා."

ඉන්පසු පුහුණු පුහුණුලාභීන් පරීක්ෂණයකට භාජනය කොට සමත් වෙන අයට වෘත්තිය පුහුණු ආයතනයේ සහතිකයක් ලබා දෙනවා. තවදුරටත් සාක්ෂි දෙමින් ඇය කියා සිටියේ පුහුණුලාභීන් තෝරා ගැනීමේදී තවත් සාධක කීපයක් බැලිය යුතු බවයි. ඒවා අතර පුහුණුලාභියාගේ වයස අවුරුදු 21ත් 45ත් අතර විය යුතුයි. වයස අවුරුදු 45ට වැඩි අය යැවීමට නම් ඇයගේ යෝග්‍යතාව පිළිබඳ වෛද්‍ය සහතිකයක් අවශ්‍ය වේ. අවුරුදු 50ට වැඩි කෙනෙකුට නම් යා හැක්කේ විදේශයේ අපේක්ෂිත සේවායෝජකයාගේ කැමැත්ත පළ කළ ලිපියක් තිබේ නම් පමණි. තවද අවුරුදු පහකට වඩා අඩු වයස ඇති ළමයින් ඇත්ද ආදී විස්තර ඇතුලත් ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන පවුල් පසුබිම් වාර්තාවක් ද අවශ්‍ය වේ.

මැදපෙරදිගට යන අය සඳහා පවත්වන වෙනම පුහුණු වැඩසටහන් ඇති අතර, සිංගප්පූරුව වැනි රටවලට යන අය සඳහා දින 21 සහ 30 වැනි දීර්ඝ වැඩසටහන් ද ඇත. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය මෙකී පන්නිපිටිය නිල පුහුණු මධ්‍යස්ථානය භාර නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සේවය කර ඇති අතර, ඇය පුහුණුවන්නන් බඳවා ගැනීම, පුහුණු වැඩසටහන් වලට යොමු කිරීම, පුහුණුවන්නන්ගේ මුදල් අයකිරීම, මුදල් ලේඛන පවත්වාගෙන යාම ආදී තම නිත්‍ය තනතුර වූ යතුරු ලේඛක තනතුරේ හෝ පුහුණු ආයතනයේ පොදු සහකාර වශයෙන් රාජකාරී ලැයිස්තුවෙන් පවරා ඇති රාජකාරී ඉක්මවා වගකිව යුතු රාජකාරී රැසක් ඉටු කළ බව පෙනේ.

වැඩබලන සහකාර කළමනාකරු ලෙස ඒ.සී. කොඩිකාර මහතා නැමැත්තෙකු මෙම පුහුණු මධ්‍යස්ථානය භාර ව කටයුතු කර ඇති අතර, මෙහි සහනය පතන ඉල්ලුම්කාරිය අලහකෝන් මහත්මිය, පොදු සහකාර III ශ්‍රේණියේ ආර්.ජී.එල්.කේ. ජයවර්ධන මහත්මිය, පොදු සහකාර (S IV) ශ්‍රේණියේ අයි.එච්.මුතුකුඩ මහත්මිය, පොදු සහකාර ශ්‍රේණියේ බී.එම්.එම්.එල්. ගුණවර්ධන මෙනවිය යන අය එහි සේවය කරමින් සිට ඇත. X5 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කළ අමාත්‍යාංශයේ විගණන නිලධාරී විසින් පවත්වන ලද විගණන වාර්තා ප්‍රකාරව මෙම පුහුණු ආයතනය බරපතළ දෝෂයන්ගෙන් ගහන ව පවත්වාගෙන ගිය ආයතනයක් බව පෙනී යයි. එකී දෝෂයන් සහ අකටයුතු පිළිබඳව මෙහි සහනය පතන අලහකෝන් මහත්මිය ඇතුළු ඉහත කී සෑම නිලධාරියෙකු ම සාමූහිකව සහ තනි තනි ව වගකිවයුතු බව කියැවේ. ඒ අනුව 2014.09.18 දින සිට ඇය වැඩ තහනමට ලක්කොට ඇත. (A2) එකී විගණන වාර්තාව පදනම් කරගෙන මෙහි සහනය පතන අලහකෝන් මහත්මියට චෝදනා 27කින් සමන්විත චෝදනා පත්‍රයක් (A3 සහ X6) විදේශ සේවා කාර්යාංශයේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබ ඇත. ඇය විසින් සපයන ලද පිළිතුරුවලින් සෑහීමකට පත් නොවීම හේතුවෙන් ඇයට විරුද්ධව විනය පරීක්ෂණ නිලධාරී එස්.කේ. ලියනගේ මහතා විසින් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා X3 ලෙස ලකුණු කළ පරීක්ෂණ වාර්තාව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති වෙත ලබා දී ඇත. එම විනය පරීක්ෂණ වාර්තාව මගින් චෝදනා 27න් අලහකෝන් මහත්මිය චෝදනා 17කට වැරදිකාරිය බවටත් චෝදනා 10කට නිවැරදිකාරිය බවටත් එකී ඒකපුද්ගල විනිශ්චය සභාව විසින් තීරණය කර ඇත. ඒ නිර්දේශ මත විනය නියෝගය ලෙස අලහකෝන් මහත්මියට විනය බලධාරියා විසින් පහත සඳහන් දඬුවම් නියම කොට ඇත.

1. වැටුප් වර්ධක දෙකක් විලම්බනය කිරීම,
2. වැඩ තහනම් ව සිටි කාලය වෙනුවෙන් කිසිදු වැටුපක් හෝ දීමනාවක් නොගෙවීම

කෙසේ වුවත් එකී විධිමත් විනය පරීක්ෂණය පවතින අතරතුර, අලහකෝන් මහත්මිය විසින් දිගින් දිගටම කරන ලද ඉල්ලීම් වලට ප්‍රතිචාරයක් වශයෙන් විනය පරීක්ෂණයේ අවසන් තීරණයට යටත් ව සහ විනය පරීක්ෂණයේ කටයුතුවලට අගතියක් නොවන පරිද්දෙන් විනය බලධාරියාගේ 2015.09.11 දිනැති ලිපියෙන් නැවත සේවයේ පිහිටුවා ඇති බව ද සඳහන් කරමි. ඒ අනුව ඇය මාස 12 ක කාලයක් වැඩ තහනමට ලක් ව සිට ඇත.

පළමුවන පාර්ශ්වය මුලින්ම තම පළමුවන ප්‍රකාශයෙන් මූලික විරෝධතා මාලාවක් ඉදිරිපත් කර ඇත. ප්‍රධාන වශයෙන් ඒවා පදනම් වන්නේ අලහකෝන් මහත්මියට එරෙහි විනය ක්‍රියාමාර්ග දෝෂ සහිත ය යන්න මත ය. විදේශ සේවා නියුක්ති කාර්යාංශය සංස්ථාවක් මිස එය රාජ්‍ය ආයතනයක් නොවන බවත්, ඒ අනුව අලහකෝන් මහත්මිය රජයේ නිලධාරියකු නොවන බවත්, ඒ හේතු නිසා ඇයට ආයතන සංග්‍රහයේ දෙවැනි කොටසේ විධිවිධාන ප්‍රකාර ව විනය පටිපාටිය පවත්වාගෙන යාම වැරදි බව ඉන් කියැවිණි. පළමුවැනි පාර්ශ්වය ස්ථාපිත කිරීමට වැයම් කළ වැදගත් ම කාරණය වන්නේ විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ නිලධාරී ලියනගේ මහතා තමාට අගතිගාමී වන ආකාරයෙන් සහ පක්ෂපාතී ව විනය පරීක්ෂණය පැවැත්වූ බවයි. එකී පරීක්ෂණ නිලධාරියා තම

රැකවරණ නිලධාරියාට ස්වාධීන ව කටයුතු කිරීමට ඉඩ නොදුන් බවත් සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න විමසා තම තත්ත්වය තහවුරු කිරීමට උත්සාහ ගත් අවස්ථාවන්හි දී ඔහු තර්ජනය කිරීම් කිරීම පවා කළ බවත් ය. පරීක්ෂණය පැවැත්වෙන අතරතුර එසේ තමාට පරීක්ෂණ නිලධාරියාගෙන් සිදුවන අගතිය පිළිබඳ ව A9 ලෙස ලකුණු කළ ලිපිය මගින් විනය බලධාරියා වන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති වෙත ලිඛිත ව දැනුම් දුන් බවත් ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බවත් බේරුම්කරණ විභාගයේදී තහවුරු කිරීමට වෑයම් කළේ ය. තවද බේරුම්කරණ විභාගය පුරාවට ම පළමුවන පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය චෝදනා පත්‍රයේ ඇතුළත් චෝදනා වලට තමා නිර්දෝෂී බවට කරුණු ඉදිරිපත් කිරීමට උත්සාහ ගත්තේ ය.

පළමුවන පාර්ශ්වයේ මූලික විරෝධතා වලට පිළිතුරු සපයමින් දෙවන පාර්ශ්වය තහවුරු කළේ රාජ්‍ය සංස්ථාවක් වුවත් විදේශ සේවා නියුක්ති කාර්යාංශය, තම ආයතනයට වෙන ම විනය පටිපාටියක් සකස් කර ගන්නා තෙක් ආයතන සංග්‍රහයේ දෙවන වෙළුම එහි විනය පටිපාටිය සඳහා යොදා ගන්නා බවට 2002 වර්ෂයේ දී 65/2002 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් තීරණය කර ඇති බවට X1 ලෙස ලකුණු කර ලේඛනය ඉදිරිපත් කරමින් තහවුරු කලේය. ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ විනය පටිපාටිය ආයතනය විසින් ඉතා විධිමත් ව සහ අගතියෙන් තොර ව ක්‍රියාත්මක කළ බවත්, තෝරාගත් විනය පරීක්ෂණ නිලධාරියා, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතයේ ලියාපදිංචි වී ඇති කෙනෙකු බවත්, එකී විනය පරීක්ෂණ නිලධාරියාත් පැමිණිල්ල මෙහෙයවන නිලධාරියාත් යන දෙදෙනා ම ආයතනයෙන් පිටස්තර පුද්ගලයින් බවත් තහවුරු කළේය. තවද අලහකෝන් මහත්මියට අවශ්‍ය ඕනෑම කෙනෙකු රැකවරණ නිලධාරියෙකු ලෙස තෝරා ගැනීමට අවස්ථාව දුන් බවත් චූදිත නිලධාරියෙකුට ලබාදෙන සියලු ලියවිලි ආදිය ලබා දුන් බවත්, රැකවරණ නිලධාරියාට ස්වාධීන ව කටයුතු කිරීමට සියලු අවස්ථාව ලබාදුන් බවත්, වාචික සහ ලේඛන සාක්ෂි මගින් තහවුරු කිරීමට වෑයම් කළේ ය. තවද එකී චෝදනා පත්‍රයේ අඩංගු චෝදනාවන් වලට ඉල්ලුම්කාරිය වැරදිකාරිය බවට මෙම බේරුම්කරණය ඉදිරියේ දී ඒත්තු ගැන්වීමට ද දෙවැනි පාර්ශ්වය බරපතළ අත්සාහයක් ගත්තේ ය. තවද විනය පරීක්ෂණ නිලධාරියාට එරෙහිව සභාපතිවරයාට පැමිණිලි කළේ යයි A9 ලෙස පළමුවන පාර්ශවය විසින් ඉදිරිපත් කළ ලිපිය කාර්යාල ලිපිගොනුවේ නොමැති බවට සාක්ෂි මෙහෙයවීමට දෙවන පාර්ශ්වය උත්සහ ගත්තේ ය. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දුන් යූ.කේ.එල්.බී. අයගම මහත්මියගෙන් සාක්ෂියේ අවස්ථා දෙකක දී මේ කාරණයේ පරස්පර බවක් ඇති බව නිරීක්ෂණය කරමි. තවද විනය පරීක්ෂණයේදී මෙතරම් චෝදනාවන්ට භාජනය වී වැරදිකාරිය වී ඇතත් ඒ වැරදි මත ඇය සේවයෙන් පහ කිරීමට පවා හැකියාවක් තිබුණත් ඇයට ලබා දී ඇත්තේ ඉතා සුළු දඬුවමක් බව ද දෙවැනි පාර්ශ්වයෙන් කියා සිටියේ ය.

ඉල්ලුම්කාරියගේ විනය බලධාරියා විසින් ඇයට එරෙහි ව ගෙන ඇති විනය ක්‍රියාමාර්ගය ඉතා විධිමත් බවට බේරුම්කරණය සෑහීමකට පත් වෙයි. තවද මෙම යොමුවෙන් ඉල්ලුම්කාරියගේ කාර්මික ආරවුලේ ඉතා ප්‍රධාන අංගය ලෙසට දක්වන්නේ ඇයට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය පක්ෂපාතී ව සහ ඇයට අසාධාරණයක් සිදුවන ආකාරයෙන් පවත්වා ඇති බවයි. විනය පරීක්ෂණයේදී යම් යම් අසාධාරණයන් සිදුවන්නේ ය යන්න විනය බලධාරියාට පැමිණිලි කළේය. යන්න සඳහන් හඹ කිරීමට ලක් වූ ඉහත දී සඳහන් කළ A9 ලිපිය හැරුණු විට, විනය පරීක්ෂණයේ හෝ විනය පරීක්ෂණ නිලධාරියාගේ හෝ දෝෂයන් කිසිවක් ඔප්පු කිරීමට පළමුවැනි පාර්ශ්වය සමත් වී නැත. එසේ එකී චෝදනාවන්ට තමන්ගේ නිර්දෝෂීභාවය කියා පෑමට මෙම බේරුම්කරණ විභාගයේ දී උත්සාහයක් ගත්තත් විධිමත් විනය පරීක්ෂණයක සාක්ෂි විභාග කොට ගත් තීරණ අභිබවා කිසියම් මැදිහත් වීමක් කිරීමට ප්‍රමාණවත් ඉදිරිපත් කිරීමක් කිරීමට පළමුවැනි පාර්ශ්වය මෙම බේරුම්කරණයේදී සමත් නොවීය. තවද චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා 27න් 10කට අලහකෝන් මහත්මිය නිවැරදිකාරිය කර තිබීමෙන් විනය පරීක්ෂණ නිලධාරියාගේ මැදහත්භාවය පිළිබඳ අදහසක් ගත හැකිය. එම නිසා විනය ක්‍රියා මාර්ග පටිපාටියේ හෝ විනය පරීක්ෂණ නිලධාරියාගේ දෝෂයන් පිළිබඳ ව පළමුවැනි පාර්ශ්වය ගෙන ඇති ස්ථාවරය බැහැර කරමි.

දෙන ලද දඬුවම් අසාධාරණ බවට පළමුවැනි පාර්ශ්වයෙන් කෙරෙන ඉල්ලීම සළකා බලන විට සැබැවින් ඇය වැරදිකරු වී ඇති චෝදනා අනුව සේවයෙන් පහ කිරීම දක්වා පවා යා හැකි දඬුවම් පැමිණවීමට විනය බලධාරියාට හැකි ව තිබුණි. ඒ අතින් ඇයට දී ඇති දඬුවම් දෙකෙන් රැකියාවට අදාළ වන වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීමේ දඬුවම ඉතා ලිහිල් එකක් ලෙස නිරීක්ෂණය කරන බැවින් එකී දඬුවමේ වෙනසක් කිරීමේ අවශ්‍යතාවක් නොමැත.

දෙවැනි දඬුවම ලෙස පනවා ඇති වැඩතහනම් ව සිටි කාලය තුල හිඟ වැටුප ගෙවීමක් නොකිරීමට ගෙන ඇති තීරණය පිළිබඳව බේරුම්කරණයේ අවධානය යොමු විය. ඇයගේ වැඩතහනම් කර ඇත්තේ 2014.09.18 දින දී ය. විනය ක්‍රියාමාර්ගය අතරතුර එහි තීරණයන්ට යටත් ව ඇය නැවත සේවයේ පිහිටුවා ඇත්තේ 2015.09.14 දින දී ය. විනය නියෝගය දී ඇත්තේ 2017.08.14 වැනි දින දී ය. විනය ක්‍රියාමාර්ගය ගනිමින් තිබුණු 2014.09.18 දින සිට 2017.08.14 දින දක්වා මාස 36ක (ආසන්න වශයෙන්) කාලයෙන් ඇයට මාස 24ක කාලයකට වැටුප් ලැබී තිබේ. වැටුප් අහිමි කොට ඇත්තේ 2014.09.18 දින සිට 2015.09.14 දින දක්වා වූ මාස 12ක (ආසන්න වශයෙන්) කාලයකට ය. විනය ක්‍රියාමාර්ගයේ එක් කොටසක කාලයකට වැටුප් ගෙව්වේ නම් ඉතිරි කාලයට ද වැටුප් ගෙවීම සාධාරණ බවට නිගමනය කරමි. තවද, නඩුවේ කරුණු ඉඳුරා ම සමාන නොවුව ද, අගවිනිසුරුතුමා ප්‍රධාන ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලක් විසින් විනිශ්චිත ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා නඩු අංක : 18/2009 දරන නඩුවේ තීන්දුවේ මෙසේ තීරණය කොට ඇත.

"Finally on consideration of all facts relevant in this case I hold that the dismissal was justified in light of the facts revealed at the inquiry as well as at the labour Tribunal. The Respondent is not entitled to any damages for the dismissal. <u>However he is entitled to all wages deprived of him during the period of his suspension and to any statutory dues he may be entitled to."</u>

ඒ සියල්ල සලකා බලන කළ අලහකෝන් මහත්මියට විනය දඬුවමක් ලෙස අහිමි කොට ඇති 2014.09.18 දින සිට 2015.09.14 දින දක්වා කාලයට (දල වශයෙන්) මාස 12ක කාලයක් සඳහා හිඟ වැටුප ලබා දීම සාධාරණ බවට නිගමනය කරමි.

කෙසේ වුවත් හිඟ වැටුප නිශ්චිත ව ගණනය කිරීමේ දුෂ්කරතාවක් පැන නගින්නේ ඒ පිළිබඳ ව බේරුම්කරණ විභාගයේදී එක එල්ලේ තොරතුරු ඉදිරිපත් නොවීම නිසා ය. එසේ හිඟ වැටුප් ගණනය කිරීමේ දී පාදක කරගත හැකි එක ම ලේඛනය වන්නේ ඉල්ලුම්කාරියගේ සාක්ෂිය ලෙස ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ අංගයක් ලෙස A13 ලෙස ලකුණු කර ඉදිරිපත් කළ ලේඛනයේ ඇයට මෙම වැඩතහනම හේතුවෙන් අහිමි වූ දේවල ලැයිස්තුවයි. මෙහි දී ඇය ඉල්ලා ඇති උසස් වීම්, ප්‍රසාද දීමනා, දිරි දීමනා, වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් ආදිය ලබා දීම පිළිබඳ තීරණයක් ගත නොහැක. කෙසේ වෙතත් ඇයට 2014 සැප්තැම්බර් මස සිට 2015 දෙසැම්බර් කාලයට අදාළව මාස 16කට හිඟ වැටුප ලෙස රු. 516,886 ක මුදලක් ලැබිය යුතු බවට එකී A13 ලේඛනයෙන් ඉල්ලා ඇත. සැබැවින් ඇය හිඟ වැටුප් හිමි විය යුත්තේ මාස 12ක කාලයකට පමණි. දෙවැනි පාර්ශ්වය මේ පිළිබඳව හබ කිරීමක් කර නොමැති බැවින් එකී ඉල්ලා ඇති හිඟ වැටුප් පදනම යටතේ මාසික වැටුප ගණනය කළ විට රු. 32,300ක් (රු. 516,886 ÷ 16= රු. 32,300) වේ. ඒ අනුව ඇය වැඩතහනමට ලක් ව සිටි කාලය වන මාස 12ක් සඳහා රු. 387,600ක් ගෙවීම සාධාරණ සහ යුක්තිසහගත ගෙවීමක් බවට නිගමනය කරමි.

ප්‍රදානය

1. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කාරියට අංක : AD/2/5/169/2014 සහ 2017.08.14 දිනැති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ත කාර්යංශයේ සභාපතිවරයා විසින් පනවා ඇති විනය නියෝගයේ පළමුවැනි දඬුවම වන වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීමේ දඬුවම වෙනසක් නොකොට ඒ අයුරෙන්ම ක්‍රියාත්මක කළ යුතුය.

2. එකී විනය නියෝගයේ දෙවැනි දඬුවම ලෙස දී ඇති වැඩ තහනම් කාලයේ හිඟ වැටුප් නොගෙවීමේ තීරණය අහෝසි කළ යුතුය.

3. ඒ අනුව, ඇයගේ මාසික වැටුප රු. 32,300ක් ලෙස සලකා මාස 12කට ගණනය කළ රු. 387,600 (රුපියල් තුන්ලක්ෂ අසූහත්දහස් හයසියය) ක මුදලක් සේවා යෝජක ආයතනය විසින් පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය වෙත ගෙවිය යුතුය.

4. මෙම ප්‍රදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට මසක් ඇතුලත මෙහි ඉහත 2 සහ 3 වැනි ප්‍රදනයන්ට අදාළ මුදල් ප්‍රමාණය නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

**එස්. විරිතමුල්ල,**
බේරුම්කරු.

2023 සැප්තැම්බර් මස 20 වැනි දින.
කාර්මික අධිකරණයේ දී ය.

EOG 11 - 0256

---

මගේ අංකය: IR/COM/03/2020/95.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.01.18 දිනැති හා අංක 2315/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.01.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බණ්ඩාරවෙල, පට්ටිය ගෙදර, පනංගල, සිල්වා ස්ටෝර්ස් බාරේ හි පදිංචි ඒ. ත්‍යාගරාජා මයා සහ 1, කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, 2. බණ්ඩාරවෙල, හෙල මුදුන, බණ්ඩාරවෙල ඩිපෝව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.10.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ**

නඩු අංකය: A/17/2023
IR/COM/03/2020/95

ඒ.ත්‍යාගරාජා මයා,
සිල්වා ස්ටෝර්ස් බාරේ,
පනංගල,
පට්ටිය ගෙදර,
බණ්ඩාරවෙල.

*පළමු පාර්ශ්වය*

*එදිරිව*

01. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

02. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
බණ්ඩාරවෙල ඩිපෝව,
හෙල මුදුන,
බණ්ඩාරවෙල.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :**

“ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් කරන ලද විගණන විමසුමෙන් පසු පැමිණිලිකරු තබන ලද වැටුප් පියවර නිසා ඔහුට අසාධාරණයක් සිදු ව තිබේද, එසේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ’’.

ඉහත නම සඳහන් ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් විමසීම ආරම්භ කරන ලද අතර ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරු පමණක් සාක්ෂි ලබා දෙමින් සහ ලේඛන ගොනු කරමින් ඉල්ලුම්කරුගේ නඩුව අවසන් කිරීමෙන් පසුව වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිකරුවන් දෙදෙනකු සාක්ෂි ලබා දෙමින් ලේඛන කිහිපයක් ගොනු කර ඇත. පාර්ශ්වයන්ගේ සාක්ෂි අවසන් වීමෙන් පසුව දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ගොනු කිරීමට අවස්ථාව ලබා දුන් අතර ඒ අනුව පාර්ශ්වයන් විසින් ලිඛිත දේශන ගොනු කොට ඇත.

පළමුවෙන් ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධව සලකා බැලීමේදී ඉල්ලුම්කරුගේ ස්ථාවරය වන්නේ වර්ෂ 2008.02.15 දින වගඋත්තරකරු යටතේ දෙවන පෙළ රියදුරෙකු වශයෙන් පත්වීමක් ලද බවත් එකී පත්වීම් ලිපිය අනුව 2008.02.21 දින සිට ඔහුට රැකියාව ලබා දී ඇති බව ඩිපෝවේ වැටුප් ක්‍රමය අනුව ගෙවීම් කරනු ලබන බව දන්වා ඒ අනුව ගෙවීම් කරන ලද බවත්ය. එකී පත්වීම් ලිපිය ඒ 1 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර එකී ලිපියේ අඩංගු කරුණු දෙස බැලීමේදී එහි දක්වා ඇත්තේ ඉල්ලුම්කරුගේ සේවා කොන්දෙසි ඇතුලත් විධිමත් පත්වීම් ලිපියක් යථා කාලයේදී නිකුත් කරන බව වුවද එවැනි විධිමත් පත්වීම් ලිපියක් මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් කිරීමට පාර්ශ්වයන් අපොහොසත් වී ඇති බැවින් එවැනි පත්වීම් ලිපියක් ලබා දී නොමැති බවට නිගමනයකට එළැඹීමට සිදු වේ.

ඉල්ලුම්කරු තවදුරටත් දන්වා සිටින්නේ ඔහුගේ මූලික වැටුප රු. 9150/- ක් බව සඳහන් කෙරුණු වැටුප් ලේඛනයක් ලබා දී ඉල්ලුම්කරු හට වැටුප් ගෙවන ලද බවත් ඒ අනුව ඉල්ලුම්කරු ඔහුගේ මූලික වැටුප රු. 9150/-ක් බවට එකඟ වී සේවය කරන ලද බවත් එලෙස සේවය කරමින් සිටියදී වර්ෂ 2017දී ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු. 9150/-ක් නොව රු. 8625/-ක් බව දන්වා සිටිමින් එලෙස වැඩිපුර ගෙවන ලද බවට සඳහන් කොට රු. 124695.85ක මුදලක් ආපසු අය කර ගන්නා බව දන්වමින් මේ වන විට රු. 81495.25ක මුදලක් අය කර ගෙන ඇති බවත් එලෙස ඔහුගේ මූලික වැටුප අඩු කිරීම සහ ආපසු මුදල් අය කර ගැනීම අසාධාරණ සහ අයුක්ති සහගත බවට තීන්දු කොට ඔහුගේ වැටුපෙන් අඩු කර ගන්නා ලද කොටස ආපසු ගෙවීමට නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටී.

වගඋත්තරකාර පාර්ශ්වය මෙම ඉල්ලීම සම්බන්ධයෙන් මූලික විරෝධතාවයක් ගොනු කරමින් එකී මූලික විරෝධතාවයට යටත්ව සාක්ෂි ලබා දෙමින් කියා සිටින්නේ ඉල්ලුම්කරුට රු.9150/-ක මූලික වැටුපක් ගෙවා ඇත්තේ වැරදීමකින් බවත් ඔහුගේ මූලික වැටුප විය යුත්තේ රු. 8625/-ක් බවත් ඒ අනුව ඔහුගේ වැටුපෙන් වැඩිපුර ගෙවන ලද මුදල අඩු කර ගැනීම කිසිසේත් අසාධාරණ නොවන බවත් එහෙයින් මූලික විරෝධතාවය පිළිගනිමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරන ලෙසත් නොඑසේ නම් වගඋත්තරකාර පාර්ශ්වයේ ස්ථාවරය පිළිගනිමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරන ලෙසත්ය.

මා දන් පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි සහ ලේඛන සලකා බැලීමට ප්‍රථම වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවය පිළිබඳව සලකා බලමි. වගඋත්තරකාර පාර්ශ්වය ගෙන ඇති ස්ථාවරය වන්නේ ඉල්ලුම්කරු විසින් දෙවන වගඋත්තරකරු ලෙස ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බණ්ඩාරවෙල ඩිපෝව නම් කර ඇති බැවින් සහ බණ්ඩාරවෙල ඩිපෝවට නෛතික පුද්ගලභාවයක් නොමැති බැවින් මෙම නඩුව පවත්වා ගෙන යා නොහැකි බවය. නමුත් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමේ ශීර්ෂය දෙස බැලීමේදී 1 හා 2 යන වගඋත්තරකරුවන් දෙදෙනාම වන්නේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය බවත් දෙවන වගඋත්තරකරුගේ ලිපිනය ලෙස බණ්ඩාරවෙල ඩිපෝවේ ලිපිනය සඳහන් කොට ඇති බව පෙනී යන අතර ඒ අනුව දෙවන වගඋත්තරකරු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බණ්ඩාරවෙල ඩිපෝව ලෙස සැලකිය නොහැකි බව පෙනී යයි. එසේම පළමු වගඋත්තරකරු වන්නේ ඉල්ලුම්කරුගේ සේවායෝජක වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය බැවින් සහ සේවායෝජක මෙම ඉල්ලීමේ වගඋත්තරකරුවෙකු වන බැවින් මෙම ඉල්ලීම විභාග කොට ප්‍රදානයක් ලබා දීම පිළිබඳව නෛතික බාධාවක් නොමැති බැවින් මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි. ඒ අනුව මෙම ඉල්ලීම පිළිබඳව ඉදිරිපත් කර ඇති සාක්ෂි සහ ලේඛන පරීක්ෂා කොට සුදුසු ප්‍රදානයක් ලබා දීම සුදුසු බවට නිගමනය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම පිළිබඳව ඉදිරිපත් ව ඇති සාක්ෂි දෙස බැලීමේදී පහත සඳහන් කරුණු දෙපාර්ශ්වය විසින්ම පිළිගෙන ඇති බව පෙනේ. එනම්

1. ඉල්ලුම්කරු වර්ෂ 2008.02.28 දින සිට පළමු වගඋත්තරකරුගේ සේවකයෙකු ලෙස දෙවන පෙළ රියදුරෙකු වශයෙන් පළමු වගඋත්තරකරුගේ බණ්ඩාරවෙල ඩිපෝවේ සේවයේ යෙදී සිටින බව,
2. වර්ෂ 2008 සිට වර්ෂ 2017 දක්වා ඉල්ලුම්කරු හට රු. 9150/- ක මූලික වැටුපක් සහ ඒ මත පදනම්ව වැටුප් වර්ධක ගෙවා ඇති බව,

වර්ෂ 2017 දී විගණනයකින් පසුව ඉල්ලුම්කරුට වැඩිපුර වැටුප් ගෙවා ඇති බව සඳහන් කරමින් ඉල්ලුම්කරුගේ වැටුපෙන් වැඩිපුර ගෙවූ බවට පළමු වගඋත්තරකරු සඳහන් කරන මුදල් ප්‍රමාණය අඩු කර ගැනීම සාධාරණ හා යුක්ති සහගතද යන බව තීරණය කිරීම මෙම ඉල්ලීම සම්බන්ධයෙන් මෙම අධිකරණය ඉදිරියේ පවතින කාරණය වේ.

පළමු වගඋත්තරකරු ඉල්ලුම්කරු හට කිසිදු අවස්ථාවක විධිමත් පත්වීම් ලිපියක් ලබා දී නොමැති අතර ඔහුගේ මූලික වැටුප කුමක්ද යන්න ඔහුට සේවා ගිවිසුමකින් දන්වා නොමැත. ඉල්ලුම්කරු ඔහුගේ මූලික වැටුප කුමක්ද යන්න දැන ගෙන ඇත්තේ ඔහුගේ වැටුප් ලේඛනයෙන් වන අතර ඔහු එය පිළිගැනීමෙන් සේවායෝජක හා ඉල්ලුම්කරු අතර පවතින සේවා ගිවිසුමේ වැටුප් පිළිබඳ කොන්දේසියට ඉල්ලුම්කරු එකඟ වී ඇති බව පෙනී යයි. එමෙන්ම වර්ෂ 2008 සිට වර්ෂ 2017 දක්වා වසර 09 කට අධික කාලයක් ඉල්ලුම්කරුගේ මූලික වැටුප ලෙස රු. 9150/-ක් (වැටුප් වර්ධක වලට යටත්ව) ගෙවා තිබෙන අතර ඒ අනුව එය සේවා ගිවිසුමේ කොන්දේසියක් බවට පත්ව ඇති අතර ඒ සඳහා පාර්ශ්වයන්ද එකඟ වී තිබෙන බව මෙම බේරුම්කරණයේ නිගමනය වේ. එමෙන්ම සේවායෝජක පමණක් දන්නා මූලික වැටුපක් ගෙවා තිබෙන අතර එය වසර 09ක දීර්ඝ කාලයක් පුරාවට ගෙවීමෙන් පසුව එක් වරම එය මූලික වැටුප නොවන බවට පැවසීම කිසිසේත්ම සාධාරණ හා යුක්ති සහගත නොවේ.

සාමාන්‍ය ගිවිසුම් නීතිය අනුව බැලීමේදී ද ගිවිසුමක කොන්දේසිවලට ලිඛිතව හෝ වාචිකව හෝ ව්‍යංගව එකඟ වීමෙන් පසු එකී කොන්දේසි එක් පාර්ශ්වයකට අභිමත පරිදි වෙනස් කළ නොහැකි අතර එලෙස වෙනස් කිරීම අනෙක් පාර්ශ්වය පිළිනොගන්නේ නම් අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක් කළ හැකි කාල සීමාවක් පැවතීම ඉල්ලුම්කරු විසින් සේවායෝජකගේ කොන්දේසි වලට එකඟ වීමෙන් පසුව වසර 09කට පසුව සේවායෝජකට අභිමත පරිදි එකී කොන්දේසි වෙනස් කිරීම අසාධාරණ හා අයුක්ති සහගත බව මෙම අධිකරණයේ නිගමනය වේ. සේවායෝජකගේ කටයුතු අතරින් විශේෂයෙන්ම මූල්‍ය කටයුතු වාර්ෂික විගණනයකට යටත්

වන අතර අභ්‍යන්තර විගණනයකටද ලක් වේ. එමෙන්ම සේවකයින්ගේ වැටුප් සැකසීම මානව සම්පත් අංශයේ අධීක්ෂණයට ලක් වන අතර ඉහත කී කිසිදු අංශයක පරීක්ෂා නොකර හෝ පරීක්ෂාවකට ලක් නොවී වසර 09ක කාලයක් පුරාවට වැටුප් ගෙවීමෙන් පසුව එක් වරම සේවකයෙකුගේ වැටුප් තලය අඩු කිරීම කිසිසේත් සාධාරණ සහ යුක්ති සහගත නොවන අතර මෙම ඉල්ලීමේදී ඉල්ලුම්කරුට ඔහුගේ වැටුප දන්වා නොතිබීම මඟින් සහ ඉල්ලුම්කරු ඔහුට ගෙවන ලද වැටුපට එකඟ වී සේවය කිරීම තුලින් පසු අවස්ථාවක ඔහුගේ වැටුප් තලය අඩු කිරීම වඩා බරපතල ලෙස අසාධාරණ සහ අයුක්ති සහගත ලෙසට මෙම අධිකරණය නිගමනය කරනු ලැබේ.

ඉහත සඳහන් සියලු කරුණු අනුව ඉල්ලුම්කරුගේ මූලික වැටුපෙන් ඔහුට වැඩිපුර ගෙවන ලද බව සඳහන් කරමින් මුදල් අය කර ගැනීමට ගත් තීරණය අසාධාරණ සහ අයුක්ති සහගත බවට තීරණය කරමි. එලෙස මුදල් අඩු කිරීම නවත්වාලමින් ප්‍රදානය ලබා දෙමි. තවදුරටත් ඉල්ලුම්කරුගේ වැටුපෙන් අඩු කර ගෙන ඇති රු. 81495.25ක මුදල ආපසු ඉල්ලුම්කරුට ගෙවන ලෙස පළමු වගඋත්තරකරුට නියම කරමි. ඉහත කී රු. 81495.25ක (අසූ එක්දහස් හාරසිය අනූ පහයි සත විසි පහ) මුදල මෙම ප්‍රදානය *ගැසට්* ගත කිරීමේ දින සිට දින 30ක කාලයක් තුළ සහකාර කම්කරු කොමසාරිස්, නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත තැන්පත් කරන ලෙස පළමු වගඋත්තරකරුට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

නීතිඥ ජනජිත් ද සිල්වා,
බේරුම්කරු.

2023 ඔක්තෝබර් මස 27 වැනි දින,

EOG 11 - 0257